**නාරම්මල ප්‍රාදේශීය සභාව - 2022**
**-----------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

නාරම්මල ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට නාරම්මල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්**,**

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියාකර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ, මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේ දී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලී බඩු හා සවිකිරීම් වටිනාකම රු.230,314ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | 2023 වර්ෂයේ දී අවසාන ගිණුම පිළියෙල කිරීමේ දී එය නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම් තැබීම කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කර්මාන්ත ණයහිමි රු.1,225,991 කින්ද කර්මාන්ත ණයගැතියෝ රු.584,356 කින්ද වැඩියෙන් දක්වා තිබුණි. | -එම- | -එම- |

### 1.6.2 නොසැසඳුණු පාලන ගිණුම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගිණුම් විෂයයන් 04 ක මූල්‍ය ප්‍රකාශන අනුව හා උප ලේඛන අතර එකතු වටිනාකම රු.2,597,066 ක වෙනසක් විය. | 2023 වර්ෂයේ එය නිවැරදිව යාවත්කාලීන කිරීමට විෂය නිලධාරිනියට උපදෙස් ලබා දුන් බව. | නිවැරදිව ගිණුම් තැබීම කළ යුතුය. |

## 1.7 අනුකූල නොවීම්

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නිති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | ප්‍රාදේශීය සභා මූල්‍ය හා පරිපාලන රීති සංග්‍රහය | | | |
| i | 61 රීතිය | වෙළඳ බලපත්‍ර, ව්‍යාපාර බදු සහ වෘත්තීය බදු පිළිබඳව වසර මුල සමීක්ෂණයක් සිදු කර ලේඛනගත කර නොතිබුණි. | ලේඛන නිවරදිව පවත්වාගෙන යාමට කටයුතු කරන බව. | අදාළ රීති උපදෙස් අනුව ක්‍රියා කළ යුතුය. |
| ii | 218 රීතිය | සභාපතිවරයා විසින් පත්කල මණ්ඩලයක් විසින් වාර්ෂිකව ඉඩම් ගොඩනැඟිලි සමීක්ෂණයක් සිදුකල යුතු වුවත් එසේ කටයුතු කර නොතිබුණි. | ඉදිරියේ දී වියිමත් පරිදි සමීක්ෂණයක් සිදු කිරීමට කටයුතු කරන බව. | -එම- |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.23,131,722 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.23,636,609 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම් රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම් | බිල්කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම් | බිල්කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 |
| I. වරිපනම් හා බදු | 12,796 | 17,790 | 12,159 | 5,631 | 12,513 | 12,590 | 12,484 | 2,806 |
| II. කුලී | 26,457 | 24,774 | 24,032 | 742 | 25,902 | 21,915 | 20,844 | 1,071 |
| III. බලපත්‍ර ගාස්තු | 1,163 | 1,852 | 1,852 | - | 1,163 | 1,100 | 1,100 | - |
| IV. වෙනත් ආදායම් | 31,296 | 74,513 | 44,663 | 29,850 | 12,590 | 43,369 | 16,553 | 26,816 |
| V. ආදායම් ආධාර | 65,390 | 72,946 | 67,502 | 5,444 | 65,588 | 62,803 | 58,467 | 4,336 |
| එකතුව | 137,102 | 191,875 | 150,208 | 41,667 | 117,756 | 141,777 | 109,448 | 35,029 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **වරිපනම් හා බදු** | | |
| | හිඟ වරිපනම් ශේෂයෙන් වර්ෂ 05 ට වැඩි හිඟ ශේෂ රු.673,332 ක් ද , වර්ෂ 03 – 05 ත් අතර හිඟ ශේෂය රු.151,133 ක් අයවිය යුතුව පැවතුණි. | හිග වරිපනම් අය කර ගැනීමට කටයුතු කරන බව. | හිඟ වරිපනම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු යුතුය. |
| (ආ) | **අක්කර බදු** | | |
| | 2022 දෙසැම්බර් 31 දිනට රු.78,641 ක හිඟ අක්කර බදු අයකරගැනීමට සභාව කටයුතු කර නොතිබුණි. | හිග අක්කර බදු අය කර ගැනීමට කටයුතු කරන බව. | හිඟ අක්කර බදු කඩිනමින් අයකර ගැනීමට කටයුතු යුතුය. |
| (ඇ) | **උසාවි දඩ හා මුද්දර ගාස්තු** | | |
| | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගේ සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2022 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.5,850,164 ක් හා මුද්දර ගාස්තු රු.24,000,000 ක් විය. | 2023 වර්ෂය තුළ එම මුදල් ගෙන්වා ගැනීමට කටයුතු කරන බව. | උසාවි දඩ හා මුද්දර ගාස්තු කඩිනමින් ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වරිපනම් බදු තක්සේරුව වර්ෂ 05 කට වරක් තක්සේරු කල යුතු වුවත් ප්‍රාදේශීය සභාව විසින් වරිපනම් බදු තක්සේරුව අවසන් වරට සිදුකර තිබුණේ 2015 වර්ෂයේදී ය. | 2011 වර්ෂයේ අවසන් වරට දියුණු ගම් ප්‍රදේශයන් ගැසට් කර ඇති අතර රට තුළ පවතින තත්ත්වය සාමාන්‍ය මට්ටමට පත්වූ පසු දියුණු ගම් ප්‍රදේශ ප්‍රකාශයට පත් කිරීමට අවශ්‍ය කටයුතු කරන බව. | වර්ෂ 05 කට වරක් වරිපනම් බදු තක්සේරුව සිදුකිරීමට සහ දියුණු ප්‍රදේශ හදුනාගෙන වරිපනම් අයකර ගැනීමට කටයුතු කල යුතුය. |
| (ආ) | ක්‍රීඩාංගනය සඳහා පරිත්‍යාග ලෙස ලැබී තිබූ ක්‍රීඩා භාණ්ඩ හා පුටු මේස වර්ග 10ක් හා පෙර පාසලට පරිත්‍යාග ලෙස ලැබී තිබූ භාණ්ඩ 06 ක වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | 2022 වර්ෂයේ ගිණුම් ගත කිරීමට නොහැකි වී ඇති බව හා 2023 වර්ෂයේ තක්සේරු කර ගිණුම්ගත කරන බව. | නිවැරදිව ගිණුම් තැබීම කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සභාව සතු නව සභා ගොඩනැගිල්ල හා ඉඩම් දෙකක වටිනාකම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | 2023 වර්ෂයේ තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව. | -එම- |

**3.2 ව්‍යාපෘතිවලින් අපේක්ෂිත නිමැවුම් මට්ටම ලබා නොගැනීම**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| නාරම්මල කිවුල්ගල්ල පානීය ජල ව්‍යාපෘතිය වෙනුවෙන් අදාල ව්‍යාපෘතිය සිදුකල ප්‍රජා සංවිධානය වෙත 2022 වර්ෂයේ රැඳවුම් මුදල් නිදහස් කර තිබූ අතර නැවත 2022 වර්ෂයේ එම ව්‍යාපෘතිය සඳහා සභාව විසින් රු.1,982,504 ක වියදමක් දරා තිබුණද, ප්‍රජාවට පානීය ජලය සැපයීමකින් තොරව ව්‍යාපෘතිය නිෂ්ක්‍රීය තත්ත්වයේ පැවතුණි. | පානීය ජල ව්‍යාපෘතිය සඳහා ජල නල එලීමේ කටයුතු අවසන් කර තිබුණද ජල මීටර් සවිකර නොතිබූ බැවින් ක්‍රියාකාරි තත්ත්වයේ නොතිබූ අතර මේ වන විට ජල මීටර් ලබා දී පානීය ජලය ලබා දීමට අවශ්‍ය කටයුතු ඉටු කරමින් පවතින බව. | පානීය ජලය සැපයීමට අදාල කටයුතු කඩිනමින් සිදුකල යුතුය. |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

**සේවක ණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසාන දිනට සේවය හැර ගිය නිලධාරීන් 02 ගෙන් රු.2,450 ක්ද, විශ්‍රාම ගිය නිලධාරීන් 04 ගෙන් රු.264,571 ක්ද අය නොවී පැවතුණි. | අදාල මුදල් අයකර ගැනීමට ඉදිරියේදී කටයුතු කරන බව. | සේවක ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**3.4 වත්කම් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඉඩම් 03ක් හා සුසානභූමියක් සභාවට පවරාගැනීමට කටයුතු කර නොතිබුණි. | පවරා ගැනීමට කටයුතු කරමින් පවතින බව. | සභාව සතු වත්කම් පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |

**3.5 නිෂ්ක්‍රීය/ ඌන උපයෝජිත වත්කම්**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 වසර මැද සිට පොදු වෙළඳ සංකීර්ණයේ මාළු කඩ කාමර අංක 04 නිශ්කාර්යව පැවතුණි. | 2022 වර්ෂයේ සිව්වන වර ටෙන්ඩර් කිරීමෙන් අනතුරුව 2022 වසර සඳහා බදු ගැනීමට කිසිවෙකු ඉදිරිපත් වී නොමැති බව. | බදුදේපල වලින් ආදායම් උපදවා ගැනීමට කටයුතු කල යුතුය. |

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ වැය විෂයය විස්තර 11 කට අදාලව ශුද්ධ ප්‍රතිපාදනය හා සත්‍ය වියදම අතර සියයට 32 සිට සියයට 96.7 දක්වා විචලනයක් ද ආදායම් විෂයයන් 04 ක අයවැයගත ආදායම් හා තත්‍ය ආදායම් අතර සියයට 53 සිට සියයට 100 දක්වා ප්‍රමාණාත්මක විචලනයන් තිබීම හේතුවෙන් අයවැය ලේඛනය ඵලාදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබුණි. | 2023 වර්ෂයේ නිවැරදිව ගණනය කර අය වැයගත කිරීමට කටයුතු කරන බව. | වර්ෂයේ ආදායම් හා වියදම් සම්බන්ධයෙන් පුරෝකථනයක් සිදුකර අයවැය ලේඛනයක් සකස් කළ යුතුය. |